ජාතික පර්යේෂණ සභාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික පර්යේෂණ සභාවේ (“සභාව”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතව මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය,ගිණුම් කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතු වෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල්කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය වසරේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත් සභාව විසින් ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව පසුගිය වසරේ සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතුය.
(ආ)	පූර්ව කාලපරිච්ඡේද වැරදි නිවැරදි කිරීමේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතු වුවත් සභාව විසින් ඉකුත් කාලපරිච්ඡේදයට අයත් එකතුව රු.1,804,837ක් වූ වැරදි නිවැරදි කිරීම් සඳහා සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති ප්‍රකාරව වැරදි නිවැරදි කිරීමේදී සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 50 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්ති ලෙස වෙන් වෙන්ව නොපෙන්වා සියලු ස්ථාවර වත්කම් කාණ්ඩ 03 කට වෙන් කර පිරිවැය වටිනාකම එකතුව රු.378,525,874 ක් හා සමුච්චිත ක්ෂය වටිනාකම එකතුව රු.35,252,172 ක් ලෙස සටහනක් මඟින් හෙළිදරව් කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව සියලු ස්ථාවර වත්කම් පන්ති ලෙස වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතුය.

(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති අංක 07 හි 92 (ආ) ඡේදය ප්‍රකාරව පිරිවැය රු.80,295,434 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතා කරන වත්කම් අයිතම 394 ක දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේදී මෙම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ලැබේ.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් එහි තවමත් භාවිතා කරන ලද වත්කම් වල දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන රු.57,140,146 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක ප්‍රකාරව 11 වර්ෂය හුවමාරු නොවන ගනුදෙනු වලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන ශුද්ධ වත්කම්/හිමිකම් ලෙස දක්වා තිබුණි.	ඉදිරියේදී ආදායම ගණනය කිරීමේදී ප්‍රමිති අංක 11 ප්‍රකාර කටයුතු කරනු ලැබේ.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව භාණ්ඩාගාර ප්‍රදාන ආදායම් ලෙස හඳුනාගත යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය තුළ උපලබ්ධි කර ගෙන තිබූ රු.116,000,000 ක් වූ ඉල්ලුම් තැන්පත් සඳහා තැන්පතු දින සිට උපලබ්ධි කළ දින දක්වා කාලපරිච්ඡේදයට අදාළ (2022 සිට 2024) රු.12,179,183 ක පොළි ආදායමෙන් ඉකුත් වර්ෂවලට අදාළ පොලී ප්‍රමාණය සමුච්චිත අරමුදලට ගැලපිය යුතු වුවත් මුළු පොලී ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා තිබුණි. තවද, රු.30,489,000 ක ඉල්ලුම් තැන්පතුවක පොළි ආදායම වූ රු.1,906,390 ක් මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොළි ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්ෂයට අදාළ නිවැරදි පොලි වටිනාකම හා ඉකුත් වර්ෂයට අදාළ වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ආ)	2016 – 2019 කාලපරිච්ඡේදය තුල රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන් (Public Private Partnership) සඳහා පෞද්ගලික පාර්ශව විසින් ලබා දී තිබූ රු.2,390,636 ක් වූ ප්‍රදාන ගිණුම් ගත කර නොතිබුණි.	පර්යේෂන ව්‍යාපෘති සඳහා පෞද්ගලික පාර්ශව විසින් ලබා දී තිබූ ප්‍රදාන ගිණුම් ගත කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	පෞද්ගලික පාර්ශව වෙතින් පර්යේෂණ සඳහා ලැබෙන මුදල් සියල්ල නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය	අභ්‍යන්තර විගණක වරයෙකු පත්කර හෝ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.	අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තකතුරක් නොමැති බැවින් එම තනතුර අනුමත කරවා ගැනීමට අදාළ ලේඛන 2021 මාර්තු 05 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට පියවර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවදී ජනරජයේ මුදල් රෙගුලසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756	2023 හා 2024 වර්ෂ වලට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු වාර්ෂිකව සිදු කර වාර්තා ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්ත මේන්තුව විසින් නිකුත් කරන ලද 2024 දෙසැම්බර් 30 දිනැති අංකTO/CFM /2023/Miscel laneous දරන, ලිපියෙහි 03 ඡේදය	භාණ්ඩාගාරයෙන් නිදහස් කර ඇති නමුත් අපේක්ෂිත කාර්යය මෙම වසර තුළ ඉටු නොවූ හෝ අදාළ කාර්යය නිම වීමෙන් පසු තවදුරටත් ඉතිරි වන මුදල් පවතීනම් එම මුදල් මුදල් වර්ෂය අවසන් වීමට පෙර භාණ්ඩාගාරය වෙත යැවිය යුතු වුවද වර්ෂය තුළ ලැබී තිබුණු රු.57,140,147 ක් පර්යේෂණ ගිණුම් වලට මාරු කර රඳවා ගෙන තිබුණි.	ID පර්යේෂණ ව්‍යාපෘති සහ TO පර්යේෂණ ව්‍යාපෘති සඳහා සභාව තුළ රදවාගෙන තිබු මුදල් 2025 වර්ෂයේදී පර්යේෂකයින් සඳහා ප්‍රදානය කර ඇත.	වර්ෂයට අදාළව ලැබෙන භාණ්ඩාගාර ප්‍රාග්ධන ප්‍රදාන සැලසුම් කළ පරිදි වර්ෂය තුල උපයෝජනය කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,229,543 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,998,778 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,228,321ක පිරිහීමක් නිරීක්ෂණය විය. පර්යේෂණ හා සංවර්ධන වියදම් රු.30,373,369 කින් වැඩිවුවද ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදාන රු.4,782,929 කින් හා පර්යේෂණ හා සංවර්ධන ලැබීම් රු.31,983,057 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2015-2021 වර්ෂවල ආරම්භ කරන ලද ව්‍යාපෘති 25 ක් සඳහා මහා භාණ්ඩාගාර ප්‍රදාන එකතුව රු.147,032,464 ක් ලබා දී තිබුණ අතර අදාළ පර්යේෂණ ව්‍යාපෘති 2016 -2024 කාලපරිච්ඡේදය තුළ නිමකළ යුතු වුවද නියමිත කාලය ඉක්මවා මාස 06 ත් මාස 40 ත් අතර කාල පරාසයක් ප්‍රමාදවී 2019 ත් 2024 ත් අතර කාලය තුළ නිමකර තිබුණි. එකී පර්යේෂණ නිමකර මාස 03 ක් ඇතුලත අවසන් වාර්තාව භාරදිය යුතු බවට ව්‍යාපෘති මාර්ගෝපදේශවල නියම කර තිබුණ ද ව්‍යාපෘතිය නිමකර මාස 01ත් 50ත් අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණද 2025 අප්‍රේල් 30 වනවිටත් අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමට හා අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිරීති වලට අනුකූලව නිසි පරිදි පාර්ශවයන් සම්බන්ධ කරගැනීම හා උචිත ලෙස සිය බලතල ක්‍රියාත්මක කළ හැකිවන පරිදි ආයතනයේ අණපනත් , ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිණිස සැලසුම් පරිදි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමටත් හැකිවන පරිදි පාලන ක්‍රමවේද සලස්වා ගැනිමට කටයුතු කළ යුතුය.
(ආ)	2015-2019 අතර වර්ෂවල ආරම්භ කළ 2016-2022 වර්ෂවල නිමකළ යුතු භාණ්ඩාගාර ප්‍රදාන එකතු වටිනාකම රු.24,547,344 කින් යුතු පර්යේෂණ ව්‍යාපෘති 07කින් ව්‍යාපෘති 03ක් වසර 04 ත් 07 ත් අතර කාලයක් ගතවී තිබුණද 2025 අප්‍රේල් මස වන විටත් නිම කර නොතිබුණි. ව්‍යාපෘති 04ක් මාස 6 ත් 18 ත් අතර කාල පරාසයක ප්‍රමාදයකට පසු 2018 හා 2024 වර්ෂවල	පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමට හා අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිරීති වලට අනුකූලව නිසි පරිදි පාර්ශවයන් සම්බන්ධ කරගැනීම හා උචිත ලෙස සිය බලතල ක්‍රියාත්මක කල හැකිවන පරිදි ආයතනයේ අණපනත් , ප්‍රතිපත්ති හා	භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිණිස සැලසුම් පරිදි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමටත් හැකිවන පරිදි පාලන ක්‍රමවේද සලස්වා

	නිමකර තිබුණි.	කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	ගැනීමට කටයුතු කළ යුතුය
(ඇ)	2021 වර්ෂයේ ආරම්භ කරන ලද 2023 හා 2024 වර්ෂ වල අවසන් කළ යුතු භාණ්ඩාගාර ප්‍රදාන එකතු වටිනාකම රු.39,232,100 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 08 ක් නියමිත දිනට අවසන් කර නොතිබුණ අතර පර්යේෂණ නිමකිරිමේ කාල ප්‍රමාදය මාස 04 ත් 22ත් අතර විය.	පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමට හා අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිරීති වලට අනුකූලව නිසි පරිදි කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිණිස සැලසුම් පරිදි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමටත් හැකිවන පරිදි පාලන ක්‍රමවේද පවත්වා ගැනිවට කටයුතු කළ යුතුය.
(ඈ)	2022 වර්ෂයේ ආරම්භ කර 2023 සැප්තැම්බර් වන විට නිමවිය යුතු අමාත්‍යාංශ ප්‍රමුඛතා ප්‍රදාන මත වන පර්යේෂණ 05 ක් වෙනුවෙන් රු.12,256,290 ක අරමුදල් ලබා දී තිබුණ අතර මාස 11 සිට 21අතර කාල ප්‍රමාදයකින් පසුව 2024 හා 2025 වර්ෂවල නිමකර තිබුණි.ඉන් පර්යේෂණ ව්‍යාපෘති 02 ක අවසන් වාර්තා විගණිත දින වන 2025 අප්‍රේල් 22 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.මෙකී ව්‍යාපෘති 04කට අදාළ එකතුව රු.2,383,723ක් වූ ඉතිරි මුදල් සුදුසු ආයෝජනයක යෙදවීමකින් තොරව බැංකු ජංගම ගිණුම්වල රඳවාගෙන තිබුණි.	පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් හා අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිරීති වලට අනුකූලව නිසි පරිදි පාර්ශවයන් සම්බන්ධ කරගැනීම හා උචිත ලෙස සිය බලතල ක්‍රියාත්මක කළ හැකිවන පරිදි ආයතනයේ අණපනත් , ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීම පිණිස සැලසුම් පරිදි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමටත් හැකිවන පරිදි අදාළ නීතිරීති හා පාලන ක්‍රමවේද පවත්වා ගැනිවට කටයුතු කළ යුතුය. ඉතිරි ව්‍යාපෘති අරමුදල් සුදුසු පරිදි ආයෝජණය කිරිමට කටයුතු කළ යුතුය.
(ඉ)	පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව හඳුනානොගැනිම හේතුවෙන් වර්ෂ 2017- 2024 අතර නිමකිරීමට නියමිතව පැවති එකතුව රු.89,833,710 ක භාණ්ඩාගාර ප්‍රදාන ලබාගෙන තිබූ පර්යේෂණ 12 ක් ක්‍රියාත්මක නොකර අත්හිටුවා තිබූ අතර එම	පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමට හා අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමට කටයුතු කරන බවත් ඊට අදාළ නීතිරීති වලට අනුකූලව නිසි පරිදි පාර්ශවයන් සම්බන්ධ කරගැනීම හා උචිත ලෙස සිය බලතල ක්‍රියාත්මක කළ හැකිවන පරිදි ආයතනයේ	පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර පූර්ව ශක්‍යයතා අධ්‍යනයක් මඟින් පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරිමට හැකියාව සලකා බැලිය යුතුය.

	මුදල්ද නිෂ්කාර්යව ජංගම ගිණුම්වල පැවතුණි.	අණපනත් , ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	
(ඊ)	පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස 2024 වසරේ රු.57,140,146 ක් භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණ ද 2025 අප්‍රේල් වන විටත් එම මුදලින් කිසිදු මුදලක් අදාළ කාර්යයට උපයෝජනය කර නොතිබුණු අතර 2025 වර්ෂය වෙනුවෙන් ද රු.230,000,000 ක් ඇස්තමේන්තුකර ප්‍රතිපාදන අනුමත කරවා ගැනීමට කටයුතු කර තිබුණි.	ප්‍රාග්ධන වියදම් අතරින්, ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා රඳවා ගත් රු.53,559,400 ක මුදල ID ව්‍යාපෘති 10 කට හා TO ව්‍යාපෘති 1 ක් සඳහා රඳවාගෙන ඇත. මෙම මුදල් 2025 වසරේදී පර්යේෂකයින් සඳහා ලබා දී ඇත.	භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් අදාළ වර්ෂයේදී නියමිත පරිදි ප්‍රයෝජනයට ගත යුතුය.
(උ)	ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක පර්යේෂණ සිදුකරන රාජ්‍ය ආයතනවලට හා විශ්වවිද්‍යාල වලට පර්යේෂණ අරමුදල් සපයමින් හා ඒවා කළමණාකරනය කරමින් විද්‍යාත්මක පර්යේෂණ ඉටුකරවීම සභාවේ කාර්යයභාරය වුවද රටේ සංවර්ධනයට වඩාත් හිතකර මාතෘකා පිළිබඳව වූ පර්යේෂණ වෙත පර්යේෂකයින් වැඩිපුර යොමුකර වීමටත්, ඒවායේ ප්‍රතිඵල ආර්ථික සංවර්ධනයට යොමු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය ආයතන හා පාර්ශවයන් සම්බන්ධ කරගැනීමටත් සිය බලතල ක්‍රියාත්මක කළ හැකිවන පරිදි නෛතික ව්‍යුහයන්, සභාවේ ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමටත් යොමුවී නොතිබුණි.	නව සොයා ගැනීම් රටේ ජනතාවගේ යහපතට යෙදවීම සඳහා සෑම පර්යේෂණ ව්‍යාපෘතියක්ම බලපෑම් තක්සේරුකරණයක් (Impact Assessment) කිරීමටත් ඒවායේ පසුවිපරම් සිදුකිරීමටත් කටයුතු මේ වන විට අරඹා ඇත.	පර්යේෂණ ප්‍රතිඵල ආර්ථික සංවර්ධනයට යොමු කිරීමට හැකිවන පරිදි සභාවේ නෛතික ව්‍යුහයන්, ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ)	TO-16-15 නමැති ව්‍යාපෘති පර්යේෂණය 2016 දෙසැම්බර් 29 දින ආරම්භ කර 2021 අප්‍රේල් 28 නිමවීමට නියමිතව තිබුණද 2023 අප්‍රේල් මස වනවිට ව්‍යාපෘතියේ සම්පූර්ණ වියදම රු.49,896,857 ක් දරා මාස 16 ක ප්‍රමාද කාලයකින් පසු නිම කර තිබුණද ව්‍යාපෘතියේ අරමුණ වූ වියලි කලාපිය පානීය ජල	TO 16 -15 ජලයේ දිය වී ඇති බැර ලෝහ හා ෆ්ලෝරයිඩ් ඉවත් කරමින් වියලි කලාපයේ පානිය ජල ගැටලුවට තිරසාර විසඳුමක් ලබා දීමේ පර්යේෂණය, 2016 දෙසැම්බර් 29 වන දින ආරම්භ වී 2023 අප්‍රේල් 28 අවසන් විය. මෙම ව්‍යාපෘතිය මඟින් වියලි කලාපයේ ජල	ව්‍යාපෘති පර්යේෂණයේ ප්‍රතිඵල සමාජ සුබසාධන හා ආර්ථික සංවර්ධනයට යොමු කිරීමට හැකිවන පරිදි සුදුසු සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය.

	අවශ්‍යතාවයට තිරසාර විසඳුමක් ලෙස මෙහි ප්‍රතිඵල ජනතාව කරා ගෙන යෑමේ අරමුණ සාර්ථක ලෙස ඉටුකර දිම සිදුකර නොතිබුණි.	ගැටළුවට විසඳුමක් ලෙස ආදර්ශ ප්‍රජා ජල ප්‍රවිත්‍රාගාරයක් සංවර්ධනය කර ඇත. මුලදී මෙම බලාගාරය ගම්වැසියන් සඳහා ඉදිකිරීමට සැලසුම් කර තිබූ අතර තෝරාගත් පොදු ස්ථානයේ (නෙත්තියගම විද්‍යාලය, මිහින්තලේ) ස්ථාපිත කරනු ලදුව වැඩි දියුණු කිරීමේ කටයුතු සැලසුම් විය. නමුත් ගමන් වියදම් සහ COVID 19 තත්වය හේතුවෙන් ජල පවිත්‍රාගාරය මහනුවර මූලික අධ්‍යන ආයතනය වෙත ගෙන ගොස් සංවර්ධන කටයුතු අවසන් කරන ලදී. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සමග එක්ව මෙම ආදර්ශ ජල පිරිපහදු යන්ත්‍රය මිහින්තලේ නෙත්තියගම විද්‍යාලය තුළ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පර්යේෂකයන් කටයුතු කරමින් සිටී.	
(ඒ)	2014 වර්ෂයේ ආරම්භකර වර්ෂ 5කින් නිම කිරීමට නියමිතව පැවති ව්‍යාපෘතියක් රු.49,900,000 ක් වැයකර වසර 09 කට පසු 2023 දෙසැම්බර් 31 දින අවසන් කර තිබුණද ව්‍යාපෘතියේ අරමුණ වූ රට තුළ සර්ප විෂ සඳහා ප්‍රතිවිෂ ඖෂධ අවශ්‍යතාවය නම් වූ ගැටලුව විසඳීමට ප්‍රමාණවත් දායකත්වයක් ඒ තුලින් ලබා දීමට නොහැකි වී තිබුණි.	මෙම ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති අවශ්‍යතාවයක් මත ආරම්භ කර ඇත. 2025 වර්ෂයේදී විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයාගේ ප්‍රමුඛතත්වයෙන් මෙම ව්‍යාපෘතිය වාණිජකරණය සඳහා මේ වනවිට රුස්වීම් 2 ක් විද්‍යා හා තාක්ෂණ අමාත්‍යශයේදී පවත්වා ඇත.	පර්යේෂණ ප්‍රතිඵල සමාජ හා ආර්ථික සංවර්ධනයට යොමු කිරීමට හැකිවන පරිදි සභාවේ නෛතික ව්‍යුහයන්, ප්‍රතිපත්ති හා කාර්යභාරය පුළුල් කිරීමට කටයුතු කළ යුතුය.

3.2 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ID ව්‍යාපෘති (Investigator Driven Projects) 04 කට අදාළ රු.11,081,442 ක අරමුදල්ද, PPP (Public private partnership Program) ව්‍යාපෘති 06 කට අදාළ රු.4,194,138 ක අරමුදල් ද ඇස්බැස්ටෝස් ව්‍යාපෘතියට අදාළ රු.396,814 ක අරමුදල්ද වශයෙන් එකතුව රු.15,672,394 ක් අදාල ව්‍යාපෘති සඳහා උපයෝජනය නොකර ජංගම ගිණුම් තුළ වර්ෂ 02 ක සිට නිශ්කාර්යව තබා තිබුණි.	අරමුදල් උපයෝජන ඵලදායී ලෙස යොදා ගැනීමට කටයුතු කිරිමට දැඩි අවදානය යොමු කිරිමට කටයුතු කරන බව.	ව්‍යාපෘති අරමුදල් අදාළ ව්‍යාපෘති සඳහා උපයෝජනය කර යම් ඉතිරියක් පවතී නම් එම මුදල් මහා භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කළ යුතුය.